# ක්‍රියාපද
# (Verbs)

යම් වීමක්, විඳීමක්, කිරීමක් වැනි ක්‍රියා අර්ථයක් ප්‍රකාශ කෙරෙන පද '**ක්‍රියා පද**' නම් වේ.

සිදත් සඟරාවේ ක්‍රියාව හඳුන්වා ඇත්තේ,

'නොදැව් නුගුණ දැව් නිසා සකරුණෙන් දමුව වැ සිදු කිරිය නම්'

'ද්‍රව්‍යයක් නොවන ගුණයක් නොවන එහෙත් ද්‍රව්‍යයක් ඇසුරුකොට ෂට්කාරක හේතුවෙන් ධාතු මූලික ව සිදුවන්නේ ක්‍රියා නම්' එහි අරුතයි.

ක්‍රියාපදයක 'මූලික ස්වරූපය' ක්‍රියාව, ක්‍රියා මූලය, ක්‍රියා ප්‍රකෘතිය, ධාතුව, ධාතු ප්‍රකෘතිය, ධාතු මූලය යන නම්වලින් හැඳින්වේ. යම් ක්‍රියාවක් ක්‍රියාපදයක් බවට පත් වන්නේ ධාතුවට ප්‍රත්‍යය එක් වූ පසුවයි. ධාතු ප්‍රධාන වශයෙන් දෙවැදෑරුම් ය.

එනම් :-

1. අකර්මක ධාතු
2. සර්මක ධාතු

**1. කර්මයක් අපේක්ෂා නොකරන ක්‍රියා ධාතු 'අකර්මක' වේ.**

උදා :- නිඳයි (නිඳ), වැටෙයි (වට්), පනියි (පන්), රඟයි (රඟ),

පහදියි (පහද), පිබිදෙයි (පුබුදු), කොඳුරයි (කොඳුර), දුවයි (දුව).

**2. සකර්මක ධාතු යනු කර්මයක් අපේක්ෂා කරන ක්‍රියා ධාතුන් ය.**

උදා :- කයි (ක), බොයි (බො), සෝදයි (සෝද) කරයි (කර)

★ සකර්මක ඇතැම් ධාතු කර්ම දෙකක් අපේක්ෂා කරන අවස්ථා ද පවතී. ඒවා ද්විකර්මක ධාතු නම් වේ.

උදා:- දෙයි (දෙව), විචාරයි (විචාර), පිලිවිසියි (පිලිවිස)

★ ඇතැම් ධාතු අකර්මක වුව ද ක්‍රියා නාම යෙදීමෙන් ඒවා සකර්මක වාක්‍ය ලෙස ලිවිය හැකි ය.

උදා :- ඔහු නැටුමක් නටයි.

ඔහු පිනුමක් පනියි.

ඇය රැඟුමක් රඟයි.

ඔහු දිවිල්ලක් දුවයි.

ඔහු මිහිරි හඬයි හඬයි.

★ තවද ඇතැම් ධාතු අකර්මක වුව ද ඒවා ප්‍රයෝජ්‍ය ක්‍රියා බවට පත් කිරීමේ දී සකර්මක බවට පත් වේ.

උදා :- අම්මා දරුවකු නිදවයි.

බල්ලා වළිගය නටවයි.

හිරු මල් පුබුදුවයි.

★ සකර්මක ධාතු ප්‍රයෝජ්‍ය ක්‍රියාවෙහි යෙදූ විට ඒවා ද්විකර්ම බවට පත් වේ.

උදා :- රජතුමා දසයා ලවා වැඩ කරවයි.

ඇමැතියා සෙබළුන් ලවා රජ පරදවයි.

★ පාලි, සංස්කෘත ආදි මාතෘ භාෂාවල දී ද්විකර්මක ධාතු ප්‍රයෝජ්‍ය ක්‍රියාවෙහි යෙදූ විට ඒවා ත්‍රිකර්මක වේ. එහෙත් සිංහලයේ දී මෙය ඒ ලෙස ම ක්‍රියාත්මක නොවේ.

උදා :- ස්වාමියා ගොපල්ලා ලවා දෙනගෙන් කිරි දෙවවයි.

★ කිසියම් ක්‍රියාපදයක 'ධාතු ප්‍රකෘතිය' සොයා ගැනීමට එය ප්‍රයෝජ්‍ය ක්‍රියාවෙහි හෝ භාව ක්‍රියාවෙහි 'නු' ප්‍රත්‍ය යෙදීම බෙහෙවින් සිදු කෙරේ.

උදා :- පන් + ව + යි > පන්වයි (පන්) කර + ව + යි > කරවයි (කර)

රක් + ව + යි > රක්වයි (රක්) බල + ව + යි > බලවයි (බල)

ය + නු > යනු (ය), එ + නු > එනු (එ), බො + නු > බොනු (බො)

★ අකර්මක ධාතු සහිත ක්‍රියාපදවලින් කර්තෘකාරක මෙන් ම භාවකාරක වාක්‍ය තැනිය හැකි ය.

උදා :- කර්තෘකාරක : මම හඬමි. කර්මකාරක :- මට හැඬේ.

★ සකර්මක ධාතු සහිත ක්‍රියාපදවලින් කර්තෘකාරක මෙන් ම කර්මකාරක වාක්‍ය තැනිය හැකි ය.

උදා :- කර්තෘකාරක :- මව පුතකු රකියි කර්මකාරක :- මව විසින් පුතෙක් රකිනු ලැබේ.

★ ක්‍රියා ධාතු :-

1. ස්වරාන්ත
2. හලාන්ත

වශයෙන් දෙවැදෑරුම් වේ.

**1. ස්වරාන්ත** :-

කිසියම් ධාතුවක් ස්වරයකින් අවසන් වේ නම් එය ස්වරාන්ත නම් වේ.

| | | | |
|---|---|---|---|
| උදා :- | බලයි | < | බල |
| | දෙයි | < | දෙ |
| | කොටයි | < | කොට |
| | කරයි | < | කර |
| | බබලයි | < | බබල |
| | නටයි | < | නට |

**2. හලාන්ත** :-

කිසියම් ධාතුවක් හල් අකුරකින් අවසන් වේ නම් එය හලන්ත වේ.

| | | | |
|---|---|---|---|
| උදා :- | ගනියි | < | ගන් |
| | පනියි | < | පන් |
| | දක්වයි | < | දක් |
| | රකියි | < | රක් |
| | බසියි | < | බස් |
| | දකියි/දිසෙයි | < | දිස් |
| | පෙනෙයි | < | පෙන් |

ධාතු ප්‍රකෘතිය අගට ප්‍රත්‍ය එක් කිරීමෙන් ක්‍රියා පද සෑදේ. එලෙස සෑදෙන ක්‍රියාපදවල මූලික ලක්ෂණ කිහිපයකි.

| | | | | |
|---|---|---|---|---|
| උදා :- | **1. වචන භේදය** :- | | **ඒකවචන** | **බහුවචන** |
| | | | යයි | යති |
| | | | කරයි | කරති |
| | | | කළේ ය | කළෝ ය |
| | | | කරන්නේ ය | කරන්නෝ ය |
| | **2. පුරුෂ භේදය** :- | ප්‍රථම පුරුෂ :- | බලයි | බලති |
| | | මධ්‍ය පුරුෂ :- | බලහි | බලහු |
| | | උත්තම පුරුෂ :- | බලමි | බලමු |

| | | | |
|---|---|---|---|
| **3. කාල භේදය :-** | වර්තමාන :- | යයි | යති |
| | අතීත :- | ගියේය/ ගියාය | ගියෝය/ ගියහ |
| | අනාගත :- | යන්නේය/යන්නීය | යන්නෝය/ යන්නාහ |

| | | |
|---|---|---|
| **4. කාරක භේදය :-** | කර්තෘකාරක :- | මව ළමයින් රකියි. |
| | කර්මකාරක :- | මව විසින් ළමයි රකිනු ලැබෙති. |
| | භාවකාරක :- | මට හැඬේ./ මට හැඬිණි. |

| | | |
|---|---|---|
| **5. ලිංග භේදය :-** | ස්ත්‍රී ලිංග :- | නංගී ගී කීවා ය. |
| | | නංගී නැටුමක් නටන්නී ය. |
| | පුරුෂ ලිංග :- | අය්යා වැඩ කළේ ය. |
| | | මාමා ගෙදර ගියේ ය. |

සිදත් සඟරාවෙහි ක්‍රියාපද කොටස් 8කට බෙදා ඇත.

| | |
|---|---|
| 1. තෙකල් කිරිය | (ත්‍රෛකාලික ක්‍රියා) |
| 2. පියදු කිරිය | (ප්‍රයෝජ්‍ය ක්‍රියා) |
| 3. විදි කිරිය | (විධික්‍රියා) |
| 4. කම් කිරිය | (කර්ම ක්‍රියා) |
| 5. ආසි කිරිය | (ආශීර්වාදක්‍රියා) |
| 6. අසහබව් කිරිය | (අසම්භාව්‍ය ක්‍රියා) |
| 7. පෙර කිරිය | (පූර්වක්‍රියා) |
| 8. මුසු කිරිය | (මිශ්‍ර ක්‍රියා) |

මහාචාර්ය විල්හෙම් ගෛගර් 'සිංහල භාෂාවේ ව්‍යාකරණයක්' නම් කෘතියෙහි සිංහලයේ ක්‍රියා පදය කොටස් 10කට බෙදා ඇත.

1. වර්තමාන ක්‍රියා
2. අතීත කෘදන්ත ක්‍රියා
3. අනාගත කෘදන්ත ක්‍රියා
4. විධි ක්‍රියා

5. ආශීර්වාද ක්‍රියා
6. අසම්භාව ක්‍රියා
7. ප්‍රයෝජ්‍ය ක්‍රියා
8. කර්ම ක්‍රියා
9. මිශ්‍ර ක්‍රියා
10. භාව ක්‍රියා

කුමාරතුංග මුනිදස මහතා ක්‍රියාපද සියල්ල ප්‍රභේද තුනකට දක්වා ඇත.

1. **ආඛ්‍යාත ක්‍රියා** :- අතීත, වර්තමාන ආඛ්‍යාත

ප්‍රයෝජ්‍ය, විධි, ආශීර්වාද, කර්ම ක්‍රියා

2. **නාම ක්‍රියා** :- මම ගුරුවරයෙක්මි.

3. **නිපාත (නෛපාතික ක්‍රියා)** :- ක්‍රියා අර්ථයක් ප්‍රකාශ කරන නමුදු වාක්‍යයක් අවසාන නොකරන ක්‍රියා මේ නම්. අසම්භාව්‍ය, පූර්ව, මිශ්‍ර ක්‍රියා මීට අයත් වේ. (මීට අමතර ව අපරක්‍රියා)

කුමාරතුංග මුනිදස මහතා ධාතු දෙකොටසක් දක්වයි.

1. **ක්‍රියාර්ථ ධාතු** :- ප්‍රකෘතියෙන් (ස්වභාවයෙන්) ම ක්‍රියාර්ථයක් ප්‍රකාශ කරන ධාතු, ක්‍රියාර්ථ ධාතු හෙවත් ක්‍රියාර්ථ ප්‍රකෘති ලෙස දක්වයි.

උදා :- ස්වරාන්ත, හලාන්ත ධාතු සහිත ක්‍රියා පද

2. **නාමාර්ථ ධාතු** :- නාම ප්‍රකෘතියකින් සාදා ගන්නා ක්‍රියා පදයි. නාම ධාතු ක්‍රියා නමින් ද මෙය හැඳින්වේ.

උදා :- දුමයි, දුමති, රජහි, රජෙක්මි. දුවක්මි. බාලයෙහි.

කුමාරතුංග මුනිදස මහතා සිංහලයේ ධාතු ගණ 6 ක් දක්වයි.

1. බල ආදි ගණය :- බලයි, බෙදයි, සොයයි, උනයි, පිනයි
2. බම ආදි ගණය :- බමයි, වසයි, කරයි
3. බණ ආදි ගණය :- බනියි, පනියි
4. පිහිට ආදි ගණය :- පිහිටයි, වැටෙයි, විකුණයි, වැටෙයි

5. රක් ආදි ගණය :- රකියි, සිටියි, බබළයි, නගයි, පුබුදුවයි

6. බස් ආදි ගණය :- බසියි, ලබයි, පතුරුවයි.

## මූලධාතු

කිසිදු පද සාධන ප්‍රත්‍යයක් නොයෙදුණු හුදෙක් ධාතු අර්ථය පමණක් දක්වෙන ප්‍රකෘති 'මූලධාතු' නම් වේ. මෙකී මූලධාතුන්හි යෙදෙන වර්ණ සංඛ්‍යාව අනුව එය ප්‍රභේද සතරකි.

| ඒකවර්ණක | ද්විවර්ණක | ත්‍රිවර්ණක | චතුවර්ණක |
|---|---|---|---|
| ය | හඬ | ගුගුර | පිරිණම |
| එ | බම | උදුර | පිරිමස |
| දන් | බල | නරඹ | සන්සිඳ |
| රක් | නට | විකුණ | |
| පන් | කර | බබළ | |
| බස් | පිස | දිලිස | |

## ක්‍රියාවර්ග

සමාපක ක්‍රියා හා අසමාපක ක්‍රියා වශයෙන් ක්‍රියාවර්ග ප්‍රධාන වශයෙන් දෙකොටසකට බෙදේ.

### සමාපක (ශුද්ධ) ක්‍රියා (අවසාන ක්‍රියා)

ක්‍රියා ධාතුවක් ඇසුරින් සකස් කරගන්නා වාක්‍යයක අවසාන ක්‍රියාවක් (ආඛ්‍යාතයක්) වශයෙන් භාවිත කළ හැකි ක්‍රියාපදයි.

මෙහි ප්‍රධාන ප්‍රභේද 4කි.

### (1). ත්‍රෛකාලික (තෙකල්) ක්‍රියා :-

එනම් අතීත, වර්තමාන, අනාගත වශයෙන් භාවිත කළ හැකි ක්‍රියා පදයි. මෙකී කාලත්‍රය ඇතැම් ව්‍යාකරණ ග්‍රන්ථවල අතීත හා අනතීත වශයෙන් දෙකොටසකට ලා සැලකේ.

1. අතීත

2. අනතීත (වර්තමාන, අනාගත)

කාලික ක්‍රියා කර්තෘකාරක, කර්මකාරක, භාවකාරක වශයෙන් කාරක තුන යටතේ ද විග්‍රහ කළ හැකි ය.

## 1. කර්තෘකාරක ඃ

කර්තෘ උක්ත ව සිටීම මෙහි ලක්ෂණයි. ක්‍රියාව කර්තෘට භාර වූ විට කර්තෘකාරක ව සිටී. මෙහිදී කර්තෘ උක්ත වී එය ප්‍රථමා විභක්ති ගන්නා අතර කර්මය අනුක්ත ව ද්විතීයා (කර්ම) විභක්ති ගනී. සකර්මක මෙන් ම අකර්මක ක්‍රියා පද කර්තෘකාරක වාක්‍යයන්හි භාවිත කළ හැකිය.

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| වර්තමාන ඃ- | මිනිසා ගෙයක් සාදයි. | මිනිස්සු ගෙවල් සාදති. |
| | තෝ (නුඹ) ගෙයක් සාදහි. | තොපි (නුඹලා) ගෙවල් සාදහු. |
| | මම ගෙයක් සාදමි. | අපි ගෙවල් සාදමු. |
| අතීත ඃ- | මිනිසා ගෙයක් සෑදුවේ ය. | මිනිස්සු ගෙවල් සෑදූහ. |
| | තෝ (නුඹ) ගෙයක් සෑදුවෙහි. | තොපි (නුඹලා) ගෙවල් සෑදුවෙහු. |
| | මම ගෙයක් සෑදුවෙමි. | අපි ගෙවල් සෑදුවෙමු. |
| අනාගත ඃ- | මිනිසා ගෙයක් සාදන්නේ ය. | මිනිස්සු ගෙවල් සාදන්නෝ ය. |
| | තෝ ගෙයක් සාදන්නෙහි. | තොපි ගෙවල් සාදන්නෙහු. |
| | මම ගෙයක් සාදන්නෙමි. | අපි ගෙවල් සාදන්නෙමු. |

## 2. කර්මකාරක ක්‍රියා ඃ

මෙහිදී කර්මය උක්ත වන අතර කර්තෘ අනුක්ත ව සිටී. එනම් කර්තෘ කර්ම විභක්ති ගන්නා අතර කර්මය ප්‍රථමා විභක්ති ගනී. කර්මකාරක වාක්‍ය සෑදීමේදී භාවිත කෙරෙන ක්‍රියාව සකර්මක එකක් විය යුතු ය.

මෙම වාක්‍ය දෙවිධියකට බෙදේ.

එනම් ඃ-

1. 'ලබ' ධාතුව යෙදීම
2. 'ලබ' ධාතුව නොයෙදීම වශයෙනි.

| | | |
|---|---|---|
| වර්තමාන ඃ- | දෙවියා විසින් මිනිසෙක් රැකෙයි. | දෙවියන් විසින් මිනිස්සු රැකෙති. |
| | (දෙවියා විසින් මිනිසෙක් රකිනු ලැබෙයි.) | (මිනිසුන් විසින් මල් කැඩෙයි.) |
| | මා විසින් තෝ බැලෙහි. | අප විසින් තොපි බැලෙහු. |
| | ඔහු විසින් මම රැකෙමි. | ඔවුන් විසින් අපි රැකෙමු. |

**අතීත** :- දෙවියා විසින් මිනිසෙක් රැකිණි. දෙවියන් විසින් මිනිස්සු රැකුණු

දෙවියා විසින් තෝ රැකිණිහි. දෙවියන් විසින් තොපි රැකුණුහු.

දෙවියා විසින් මම රැකිණිමි. දෙවියන් විසින් අපි රැකුණුමු.

**අනාගත** :- දෙවියා විසින් මිනිසෙක් රැකෙන්නේය. දෙවියන් විසින් මිනිස්සු රැකෙන්නෝය.

දෙවියා විසින් තෝ රැකෙන්නෙහි. දෙවියන් විසින් තොපි රැකෙන්නෝය.

දෙවියා විසින් මම රැකෙන්නෙමි. දෙවියන් විසින් අපි රැකෙන්නෙමු.

| **කර්තෘකාරක සහ කර්මකාරක සංසන්දනය** | |
|---|---|
| 1. කර්තෘ උක්තවීම | කර්මය උක්තවීම |
| 2. කර්තෘ ප්‍රථමාවෙන් සිටී | කර්මය ප්‍රථමාවෙන් සිටී. |
| 3. අකර්මක/ සකර්මක ධාතු දෙකෙහි ම ක්‍රියාරූප සමඟ යෙදේ. | සකර්මක ධාතු ක්‍රියා රූපවල පමණක් යෙදේ. |
| 4. කර්මය කර්ම විභක්ති ගනී. | කර්මය ප්‍රථමා විභක්ති ගනී. |
| 5. ආඛ්‍යාතය උක්ත කර්තෘ අනුව සිටියි. | ආඛ්‍යාතය උක්ත කර්මය අනුව සිටියි. |

**3. භාවකාරක ක්‍රියා** :-

ක්‍රියාමාත්‍රය පමණක් හඟවන්නේ භාවක්‍රියා නමින් හැඳින්වේ. මෙහි පුරුෂභේද, උක්තකර්තෘ භේද, උක්තකර්මභේද නොමැත. කාලභේද පමණක් යෙදේ.

උදා :- මට හැඬේ / හඬෙන්නේ ය. / හැඬුනේ ය, / හැඬුණි.

ඇයට නැටේ, / නැටෙන්නේ ය, /නැටුණේ ය, /නැටුණි.

**(2). ප්‍රයෝජ්‍ය ක්‍රියා (පියදු කිරිය)** :-

අනුන් ලවා කරවීමයි. මෙහි කොටස් දෙකක් පවතී.

එනම් :- 1. ප්‍රයෝජක - ක්‍රියාව කරවන්නා

2. ප්‍රයෝජ්‍ය - ක්‍රියාව කරන්නා

මෙහි ධාතුවෙන් පරව ප්‍රත්‍යයට පළමු ව 'ව' විකරණය යෙදේ. ප්‍රයෝජ්‍ය ක්‍රියාවේ ප්‍රභේද සතරකි.

1. ප්‍රේෂණ :- පහත් කෙනකු ක්‍රියාවක යෙදවීම.

උදා :- ස්වාමියා සේවකයා ලවා ගස සිටවයි.

2. අනුග්‍රාහක :- ක්‍රියාව කරන්නවුන් අනුග්‍රහක පූර්වක ව ක්‍රියාවේ යෙදවීම.

උදා :- දායකයෝ භික්ෂූන් වළඳවති.

3. අධ්‍යෙෂණ :- සත්කාර පූර්වක  අනුශාසනයෙන් ක්‍රියාවේ යෙදවීම.

උදා :- උපාසකයා භික්ෂුව ලවා බණ කියවයි.

4. අනුමිත :- වැඩිහිටියකුගේ අනුදැනුම ඇති ව ක්‍රියාවේ යෙදවීම

උදා :- ඇදුරා සිසුන් ලවා අකුරු ලියවයි.

සේනාධිපති සෙබළුන් ලවා යුද දක්වයි.

**ප්‍රයෝජ්‍ය ක්‍රියාව වෙනත් ක්‍රියා හා සම්බන්ධව යෙදෙන අවස්ථා.**

★ විධි ක්‍රියා :- කරවව, කවව

★ ආශීර්වාදක්‍රියා :- දිනවාවා, නටවාවා

★ අසම්භාව්‍ය ක්‍රියා :- කරවත, කවවත

★ පූර්ව ක්‍රියා :- කරවා, නටවා

★ මිශ්‍ර ක්‍රියා :- දුවවමින්, යවමින්,

අකර්මක ක්‍රියාවක් ප්‍රයෝජ්‍ය ක්‍රියාවෙහි යෙදූ විට සකර්ම වේ.

උදා :- මව දරුවා නහවයි.

මව දරුවා සතපවයි.

සකර්මක ක්‍රියාවක් ප්‍රයෝජ්‍ය ක්‍රියාවෙහි යෙදූ විට එය ද්විකර්මක වේ.

උදා :- අම්මා අක්කා ලවා මල් කඩවයි.

අය්යා මල්ලී ලවා රෙදි සෝදවයි.

ද්විකර්මක ක්‍රියාවක් ප්‍රයෝජ්‍ය ක්‍රියාවෙහි යෙදූ විට පාලි, සංස්කෘත භාෂාවලට අනුව එය බහු කර්මක වේ. එහෙත් එය සිංහලයේ දී ද්විකර්මක ලෙස තැබේ.

උදා :- ගෘහපතියා ගොපල්ලා ලවා දෙනගෙන් කිරි දෙවවයි.

## (3). විධික්‍රියා (විදි කිරිය)፡ -

විධානය හෙවත් ඇණවීම සඳහා යොදන ක්‍රියා මෙනම්. විධික්‍රියා යෙදෙන්නේ මධ්‍යම පුරුෂයේ පමණි.

මෙහි ප්‍රභේද කිහිපයකි.

1. ගෞරවාර්ථය - වඩින්න, එනු මැනැවි, වදුරව
2. ආදරාර්ථය - එන්න, කියන්න, එන්නකෝ, කියන්නකෝ
3. මධ්‍යස්ථාර්ථය - එන්න, කන්න, බොන්න
4. අනාදරාර්ථය - වර, යව, කාපිය, අහපන්, අහපිය

ඇතැමෙක් මෙම ප්‍රයෝජ්‍ය ක්‍රියාව මීට වඩා වෙනස්ව ද ප්‍රභේදගත කොට ඇත.

එනම් :-

| | | | |
|---|---|---|---|
| 1). ආදර :- | 1. නිමන්ත්‍රණ (හිතවත් විධාන) | : | එන්න, යන්න |
| | 2. ආමන්ත්‍රණ (ඉල්ලා සිටීම) | : | එන්නකෝ, වඩින්නකෝ |
| | 3. අධීෂ්ට (සත්කාර පූර්වක ඉල්ලීම) | : | එනු මැනැවි, දෙනු මැනැවි |
| 2). අනාදර :- | 4. විධාන (අණකිරීම) | : | එනු, යනු, යව, එව |

## (4). ආශීර්වාද (ආසි) ක්‍රියා :-

තවම ඉටු නොවූ දෙයක් ප්‍රාර්ථනා කිරීම මෙයින් පැවැසේ. ඇතැමෙක් මෙය ප්‍රාර්ථනා ක්‍රියා නමින් ද හඳුන්වති. මෙහි ප්‍රභේද දෙකකි.

එනම් :-

1. ශුභ සෙත්වේවා (යහපත් ප්‍රාර්ථනා)
2. ශාප භංගවේවා (අයහපත් ප්‍රාර්ථනා)

මෙහිලා බෙහෙවින් භාවිත වන්නේ 'වා' ප්‍රත්‍යයයි.

උදා :- සෙත්වේවා, සැපවේවා, මැරේවා, දිනේවා, නැසේවා

'වා' ප්‍රත්‍යය නොයෙදී සකසා ගන්නා ආශීර්වාද ක්‍රියා පද ද දක්නට ලැබේ.

උදා :- සැරද, සැරදේ, දිනේ, වැජඹේ

සමාපක ක්‍රියා යටතේ දක්වෙන ඉහත සඳහන් ත්‍රෛකාලික ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධි ක්‍රියාවලට ආශීර්වාද ක්‍රියාවලට අමතර ව තවත් ක්‍රියා වර්ග කිහිපයක් දක්නට ලැබේ.

### (5). ප්‍රකෘති සමවාය ක්‍රියා :-

සමවාය යනු එක්වීමයි. ප්‍රකෘති දෙකක් එක්වීමෙන් සෑදෙන ක්‍රියා මෙනමින් හැඳින්වේ.

උදා :- කියාපායි, ගිලදමයි, බිඳවැටෙයි, හැරදමයි, හැරපියයි,

කියාලයි, පැනයයි, හාරාදමයි, බිඳදමයි, සෝදහරියි.

### (6). නිරුත්සාහක ක්‍රියා :-

කර්තෘගේ උත්සාහයකින් තොරව ඉබේ සිදුවන ක්‍රියා මෙනමින් හැඳින්වේ. මෙහි විශේෂතා කිහිපයකි. එනම් :-

I. අකර්මක ධාතුවෙන් සෑදීම
II. කර්තෘගේ උත්සාහයක් නැතිබව
III. ඉබේ සිදුවීම
IV. කර්මකාරක ක්‍රියාරූපය ම යෙදීම

උදා :- පෙනේ දකුණ මහසෙන් දෙව්රදපාය.

ඇසේ ළමා වසුපැටියන් හඬ දුරට.

පෙනණි සුවාසූදහසක් හිමව් කුළු.

| වර්තමාන | | අතීත | |
|---|---|---|---|
| ඒකවචන | බහුවචන | ඒකවචන | බහුවචන |
| පෙනේ | පෙනෙත් | පෙනිණි | පෙනුණු |
| පෙනෙහි | පෙනෙහු | පෙනිණිහි | පෙනුණුහු |
| පෙනෙමි | පෙනෙමු | පෙනිණිමි | පෙනුණුමු |
| (පෙනිමි) | (පෙනුමු) | | |
| බැබලේ | බැබලෙත් | බැබලිණි | බැබලුණු |
| බැබලෙහි | බැබලෙහු | බැබලිණිහි | බැබලුණුහු |
| බැබලෙමි | බැබලෙමු | බැලලිණිමි | බැබලුණුමු |

### (7). ශ්‍රැති සූචනාර්ථ ක්‍රියා :-

ඇසූ යමක් ප්‍රකාශ කිරීමේදී මෙලෙස ක්‍රියා පද භාවිත වේ. මෙහිදී 'ල' 'ලු' යන ප්‍රත්‍ය භාවිත කෙරේ.

'ල' > කීයේල, ගියෙල

'ලු' > ගියේලු, ආවාලු

## අසමාපක ක්‍රියා (අනවසාන ක්‍රියා)

යම් ක්‍රියා අර්ථයක් ප්‍රකාශ කරන එහෙත් අවසාන ක්‍රියා ගණයට අයත් නොවන ක්‍රියා මීට අයත් වේ. මෙහි ප්‍රභේද කිහිපයකි.

## (7). අසම්භාව්‍ය ක්‍රියා :-

කාල පුරුෂ භේද රහිත ව අනියමාර්ථයක් හෝ කාලාර්ථයක් ප්‍රකාශ වන්නේ අසම්භාව්‍ය ක්‍රියා නම් වේ.

| | | | |
|---|---|---|---|
| **1. අනියමාර්ථය :-** | අ | > | බැලුව |
| | ත | > | වැසි වසිත ගඟ පිරේ. |
| | හොත් | > | කරතොත් කරපත් හරියට. |
| | තු | > | බසිතු |
| | ත් | > | බලත් |

| | | | |
|---|---|---|---|
| **2. කාලාර්ථය :-** | දී | > | වසි වසිද්දී අකුණු ගසයි. |
| | | > | කරද්දී, යද්දී |
| | ත | > | කියත උන් මෙතෙපල ආයෙය ඇදුරු ගුත්තිල. |
| | ත් | > | සඳ පායත් කුමුදු පිපේ. |

## (8). පූර්ව ක්‍රියා :-

කර්තෘගේ අවසාන ක්‍රියාවට මුලින් යෙදෙන ක්‍රියා මෙනමින් හැඳින්වේ.

| | | | |
|---|---|---|---|
| මෙහි යෙදෙන ප්‍රත්‍ය නම් :- | ඇ | > | වැදූ, බුදු වැ, පින් කොටැ |
| | ආ | > | පුරා, අරා |
| | ඊ | > | පැරැදී, වැරැදී, මැරී |
| | ඉත් | > | ගොසින්, කොටින්, අවුදින් |
| | ඇලා | > | දැකැලා, රැකැලා |
| | ආලා | > | ගොතාලා, කවාලා |
| | අලා | > | කරලා, බලලා |
| | ඊලා | > | බීලා, පිබිදීලා |
| | ඉන්ලා | > | ගොසින්ලා, ඇවිදින්ලා |

මීට අමතරව අවුත්, ගොස්, අවුදු, කොට ආදී පද ද පූර්ව ක්‍රියා ලෙස භාවිත වේ.

තවද පූර්ව ක්‍රියා දෙකක් එක් වූ විට එය මිශ්‍ර ක්‍රියාවක් ලෙස භාවිත වේ.

උදා :- කකා, ගයගයා, කරකර

## (9). මිශ්‍ර ක්‍රියා :-

අවසාන ක්‍රියාව සමග යෙදෙන ක්‍රියා මිශ්‍ර ක්‍රියා නමින් හැඳින්වේ.

මීට අයත් ප්‍රත්‍ය :-

1. මින් > කරමින්, කමින්, යමින්, දුවමින්
2. මින > කරමින, දුවමින, නරඹමින, වඩමින
3. මිනි > දුවමිනි, බලමිනි, ලියමිනි, නටමිනි
4. මිනි > ගයමිනි, නටමිනි, දුවමිනි, පිබමිනි

★ ඇතැම් තැනෙක පූර්වක්‍රියාර්ථයෙහි මිශ්‍රක්‍රියාව යෙදේ.

උදා :- මතු දියුණුව පතමින් උගනියි.

පැරුම් පුරමින් බුදුබව ලබයි.

★ පූර්වක්‍රියා රූප දෙකක් එක් වූ විට මිශ්‍ර ක්‍රියා අර්ථයක් සහිත පදයක් සෑදේ.

උදා :- දුවදුවා, බලබලා, කරකර, නටනටා, කකා, බිබී

★ මීට අමතර ව

## අපරක්‍රියා :-

අනාගතයේ සිදුවන ක්‍රියා හැඳින්වීමට සාමාන්‍ය අනාගත කාල ක්‍රියාවලට අමතරව අසමාපක ක්‍රියා යටතේ අපරක්‍රියා භාවිත වේ. අතීතයට අදාළ පූර්වක්‍රියාවට ප්‍රතිවිරුද්ධ වූ අපරක්‍රියා අනාගත කාලය භජනය කරයි. පූර්වක්‍රියා මෙන් ම අපරක්‍රියා ද අනවසාන ක්‍රියා ගණයට අයත් වේ.

උදා :- කියනුව දිවාරය කියම් බුදුගුණ අලංකාරය.

ලබනුව සිව් දහන් පැවිදි කරවා දුන් කමටහන්.

බුදුබව ලබනුව දරුවන් දන්දුණි.

## නාමධාතුක ක්‍රියා :-

නාමපදය ක්‍රියාර්ථයක් ප්‍රකාශ කිරීම සඳහා භාවිත වීම මෙහිදී සිදුවේ.

උදා :- මිනිසෙකි. මිනිස්හ.

මිනිසෙහි. මිනිස්හු.

මිනිසෙක්මි. මිනිස්මු.